# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1868/56 - 2014 ජුනි මස 25 වැනි බදාදා - 2014.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ කල්මුණේ මහ නගර සභාවේ උප නගරාධිපති ධූරයේ පුරප්පාඩුව පිරවීම

උප නගරාධිපති, නගරාධිපති ධූරයට පත්වීම හේතුකොට ගෙන කල්මුණේ මහ නගර සභාවේ උප නගරාධිපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ, උප නගරාධිපති වන මොහමඩ් නිසාම් කාරියප්පර් නම් වූ උප නගරාධිපති අයත් වන්නා වූ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත උප නගරාධිපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ කල්මුණේ මහ නගර සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා මොහමඩ් ඉබ්‍රාලෙබ්බේ මොහමඩ් ෆිර්ධවුස් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කල්මුණේ මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී දොන් තිළිණ ඉෂාන් වික්‍රමරත්න වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මොහමඩ් ඉබ්‍රාලෙබ්බේ මොහමඩ් ෆිර්ධවුස් මහතා කල්මුණේ මහ නගර සභාවේ උප නගරාධිපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

තිළිණ වික්‍රමරත්න,
තේරීම්භාර නිලධාරී,
කල්මුණේ මහ නගර සභාව.

2014 ජුනි මස 23 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර.

07 - 310

1A - G 019789 — 15 (2014/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*